ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.12.17

ඩබ්.විජේසූරිය
අළුත්හල්මිල්ලෑව,
බෝගහවැව.

පැමිණිලිකාර පාර්ශවය

01. උප.පො.ප. සුදත් ප්‍රියශාන්ත (විශ්‍රාමික)
18 කණුව, පදවිය.

02. පො.කො. 94507 කුමාර
පොලිස් ස්ථානය, පදවිය
(වර්තමාන සේවා ස්ථානය: පොලිස් ස්ථානය, බෝගස්වැව)

03. පො.කො. 101676 පිටදෙණිය
පොලිස් ස්ථානය, පදවිය

04. පො.කො. 75131 වික්‍රමරත්න
පොලිස් ස්ථානය, පදවිය
(වර්තමාන සේවා ස්ථානය: පොලිස් ස්ථානය, විලච්චිය)

05. පො.කො. 81247 රත්නායක
පොලිස් ස්ථානය, පදවිය
(වර්තමාන සේවා ස්ථානය: පොලිස් ස්ථානය, ත්‍රිකුණාමලය)

06. පො.කො. 93801 සුරංග
පොලිස් ස්ථානය, පදවිය
(වර්තමාන සේවා ස්ථානය: මූලස්ථාන පොලිස් ස්ථානය, කැබිතිගොල්ලෑව)

07. පො.සැ. 64679 දයාවංශ
පොලිස් ස්ථානය, පදවිය

08. ප්‍ර.පො.ප. එම්.ඩබ්.ඩබ්. කුමාරසිරි
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, පදවිය

වගඋත්තරකාර පාර්ශවය

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය : HRC/ANU/387/2023(I)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු 2023.07.31 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා ගොවිතැන් කටයුතු කරමින් තම ජීවිකාව ගෙවන බවත්, තම බිරිඳ, දරුවන් හා දෙමාපියන් සමඟ ජීවත් වන බවත් ය. 2023.07.26 වන දින සවස බාලයාවැව තමා විසින් වගා කර ඇති කුඹුරේ වතුර හැරවීම සඳහා තමා කුඹුරට ගිය බවත්, එදින රාත්‍රිය එහි ගත කළ බවත්, තම පියා අනුරාධපුර ශික්ෂණ රෝහලේ පැවැත්වෙන සායනයකට රැගෙන යාමට තිබූ බැවින් 2023.07.27 වන දින පාන්දර 3.30ට පමණ අළුත්හල්මිල්ලෑව පිහිටි තම නිවස වෙත ඒමට පිටත් වූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එලෙස තම යතුරු පැදියෙන් ගෙදර එමින් සිටියදී අළුත්හල්මිල්ලෑව කනත්ත ආසන්නයේදී පුද්ගලයෙකු පාර මැදට පැන තමා නැවැත්වීමට උත්සාහ කළ බවත්, ඒ සමඟම බෝගස් හන්දිය දෙසින් තමා දෙසට වාහනයක් පැමිණි බවත්, පාරේ සිටි පුද්ගලයා ඔහුගේ අත තිබූ පාර්සලයක් විසිකර දමා පාරෙන් පැන අසල තිබූ කැලය දෙසට දුවගිය බවත්, වාහනයේ පැමිණි අය තමා වටකර කැලේ තිබූ පාර්සලය ද ගෙනවිත් එය දමා ගිය පුද්ගලයා පිළිබඳව තොරතුරු විමසූ බවත්, එම පුද්ගලයා නොහඳුනන බව තමා ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එහෙත් ඔවුන් එය පිළිනොගත් බවත්, පැමිණි පිරිස පදවිය පොලිස් ස්ථානයේ නිලධාරීන් බවට ප්‍රකාශ කළ බවත්, තමා බොරු කියන බව පවසමින් එම ස්ථානයේ සිටි පොලිස් නිලධාරීන් පස් දෙනෙකු පොලු කඩාගෙන ඉතා අමානුෂික ලෙස එම පොලුවලින් තමාට පහරදුන් බවත්, තමාව බිම දමා ඔවුන්ගේ සපත්තු සහිත පාදවලින් පහරදී අළුත්හල්මිල්ලෑව පාලම යටට ගෙන ගොස් එහිදී ද අමානුෂික ලෙස පහරදුන් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එලෙස පහරදෙමින් පැන ගිය පුද්ගලයා කවුරුන් ද යන්න දිගින් දිගටම විමසූ බවත්, ඒ සෑම අවස්ථාවකදීම පැන ගිය පුද්ගලයා කවුරුන්ද යන්න තමා නොදන්නා බව ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

පසුව තමාව පදවිය පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් සිර මැදිරියේ රඳවා තබන ලද බවත්, රඳවා සිටින ලද කාලය තුළ ආහාර හෝ වතුර ලබා නොදුන් බවත්, සිදුවූ තුවාලවලට කිසිදු ප්‍රතිකාරයක් ලබා නොදුන් බවත්, කැබිතිගොල්ලෑව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඇප ලබාදුන් බවත්, ඇප ලැබීමෙන් අනතුරුව තුවාල සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට කැබිතිගොල්ලෑව රෝහල වෙත ගිය බවත්, එම රෝහලෙන් අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත මාරු කර යැවූ බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**1 වන වගඋත්තරකාර උ.පො.ප. සුදත් ප්‍රියශාන්ත යන අයගේ කරුණු දැක්වීම**

1 වන වගඋත්තරකාර උ.පො.ප. සුදත් ප්‍රියශාන්ත යන නිලධාරියා ප්‍රකාශ කර සිටින්නේ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීගේ හා ස්ථානාධිපතිගේ නියෝග මත 2023.07.27 වන දින පැය 2.00 සිට 6.00 දක්වා

පුල්මුඩේ පාර මාර්ග බාධක රාජකාරී සඳහා පිටව ගිය බවත්, අළුත්හල්මිල්ලෑව පාලම පසුකර ටික දුරක් ගොස් මාර්ග බාධක රාජකාරියේ යෙදී සිටියදී පුල්මුඩේ දෙස සිට බෝගස් හන්දිය දෙසට යතුරු පැදියෙන් පැමිණි අයෙකු හට පො.සැ. 64679 දයාවංශ නිලධාරියා විසින් විදුලි පන්දම දල්වා නලාව නාද කර යතුරු පැදිය නතර කරන ලෙසට සංඥා කරන ලද බවත්, එකී යතුරු පැදිය නවත්වනවාත් සමඟම යතුරු පැදියෙන් පැමිණි යතුරු පැදිකරු යතුරු පැදියෙන් පැන කැලෑව දෙසට පැන ගිය බවත් ය.

එසේම, යතුරු පැදිය පරීක්ෂා කිරීමේදී පාර්සලයක් යතුරු පැදියේ පිටුපස ගැට ගසා තිබූ බව දුටු බවත්, පසුව එය පරීක්ෂා කර බලන ලද බවත්, එහි මස් වර්ගයක් අඩංගුව තිබූ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. මෙම අවස්ථාවේදී යතුරු පැදියේ කිසිදු ලියවිල්ලක් නොතිබූ බවත්, මේ පිළිබඳව පොලිස් ස්ථානය වෙත තොරතුරු ලබාදී පසුව යතුරු පැදියේ අයිතිකරු පිළිබඳව මෝටර් රථ කාර්යාලයට තොරතුරු ලබාදී යතුරු පැදියේ අයිතිකරු පිළිබඳව තොරතුරු ලබාගත් බවත්, එහිදී අයිතිකරු තලාව ප්‍රදේශයේ අයෙකු බවට තොරතුරු ලැබුණු බවත් 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

එමෙන්ම, ලබා ගත් තොරතුරු අනුව මස් ප්‍රවාහනය කළ පුද්ගලයා සොයා පො.සැ. 64679දයාවංශ නිලධාරියා සහ සෙසු නිලධාරීන් පිටව ගිය බවත්, ටික වේලාවකට පසුව දයාවංශ නිලධාරියා සහ අනෙකුත් නිලධාරීන් පුද්ගලයෙකු රැගෙන ආ බවත්, එම පුද්ගලයා මස් සන්තකයේ තබා ගත් පුද්ගලයා බවට තමාහට දැනුම්දෙන ලද බවත්, ඒ අනුව තමා විසින් මස් ප්‍රවාහනය කළ වරදට එම පුද්ගලයාව (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කරන ලද මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) අත්අඩංගුවටගත් බවත් 1 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත. එසේම, පැමිණිලිකරු හට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත් 1 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 3 වන වගඋත්තරකාර පො.කො. 101676 පිටදෙණිය, 4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො.කො. 93801 සුරංග සහ 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ යන නිලධාරීන් විසින් ඉහතින් සඳහන් කර ඇති 1 වන වගඋත්තරකාර උ.පො.ප. සුදත් ප්‍රියශාන්ත යන අය විසින් ප්‍රකාශ කර ඇති කරුණු හා සමාන කරුණු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

<u>8 වන වගඋත්තරකාර පදවිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිගේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලට අදාළව පදවිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. එම්.ඩබ්.ඩබ්. කුමාරසිරි මහතා විසින් අංක 1202/2024 සහ 2024.07.05 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2023.07.27 වන දින පුල්මුඩේ පාර, 03 කණුව හන්දිය අසල විශේෂ

අපරාධ හා දූෂණ මර්දන රාජකාරි සඳහා ක්ෂණික මාර්ග බාධක රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් විසින් එම අවස්ථාවේදී මාර්ග බාධකය අසලින් අංක එන්.ඩී.සී.එම්.3886 දරණ යතුරු පැදියෙන් ගමන්ගත් පුද්ගලයෙකු නවතා පරීක්ෂා කර ඇති බවත්, එම පරීක්ෂාවේදී යතුරු පැදියේ පිටුපස තිබූ බෑගයක් ද පරීක්ෂා කර ඇති බවත්, එම බෑගය තුළ නීතිවිරෝධී මස් තිබී ඇති බවත්, ඒ අනුව මුව මස් කිලෝ ග්‍රෑම් 02ක් ප්‍රවාහනය කිරීමේ වරදට අළුත්හල්මිල්ලෑව, බෝගහවැව ලිපිනයේ පදිංචි විජේරත්නගේ විජේසූරිය (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කරන ලද මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) යන අයව 2023.07.27 දින පැය 5.00ට එකී වරද කියා දී අත්අඩංගුවට ගෙන ඇති බවත් ය.

එසේම, 2023.07.27 වන දින පැය 5.00ට අත්අඩංගුවට ගත් සැකකරුව 2023.07.27 වන දින පැය 11.50 දක්වා රඳවා ගබා ගත් බවත්, ඉන්පසුව එදිනම ඔහුව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් 8 වන වගඋත්තරකාර පදවිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සිය වාර්තාව මගින් දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පැමිණිල්ල අනුව ඔහු තම යතුරු පැදියෙන් 2023.07.27 වන දින පාන්දර 3.30ට පමණ බාලයාවැව ඔහු විසින් වගා කර ඇති කුඹුරේ සිට තම නිවස වෙත එමින් සිටියදී පුද්ගලයෙකු පාර මැදට පැමිණ ඔහුගේ යතුරු පැදිය නැවැත්වීමට උත්සාහ කළ බවත්, ඒ සමගම බෝගස් හන්දිය දෙසින් වාහනයක් පැමිණි බවත්, එවිට පාරේ සිටි පුද්ගලයා ඔහු සතුව තිබූ පාර්සලයක් පාරට විසිකර දමා කැලයට දිව ගිය බවත්, එලෙස වාහනයකින් පැමිණ ඇත්තේ පදවිය පොලිස් ස්ථානයේ නිලධාරීන් පිරිසක් වන බවත්, ඔවුන් පාර්සලය දමා පැන දිවූ පුද්ගලයා පිළිබඳව පැමිණිලිකරුගෙන් තොරතුරු විමසූ අවස්ථාවේ දී පැමිණිලිකරු එකී පුද්ගලයා පිළිබඳව නොදන්නා බව පැවසූ විට පැමිණිලිකරු හට අමානුෂික ලෙස පහරදී අත්අඩංගුවට ගනු ලැබූ බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන්ගේ වාර්තාව හා දිවුරුම් ප්‍රකාශ අනුව 1 සිට 7 දක්වා වගඋත්තරකරුවන් 2023.07.27 වන දින පැය 2.00ට සිට පැය 6.00 දක්වා කාලය තුළ මාර්ග බාධක රාජකාරියක යෙදී සිටියදී පුල්මුඩේ දෙස සිට බෝගස් හන්දිය දෙසට පැමිණි යතුරු පැදියක් පරීක්ෂා කළ බවත්, එම යතුරු පැදියේ පිටුපස කොටසේ ගැට ගසා තිබූ පාර්සලයක නීතිවිරෝධී මස් තිබූ බවත්, යතුරු පැදිය පැද ආ පුද්ගලයා එම අවස්ථාවේදී පැන ගිය බවත්, මෝටර් රථ කාර්යාලයෙන් අදාළ යතුරු පැදියේ හිමිකරු සම්බන්ධව ලබා ගන්නා ලද තොරතුරු අනුව පැන ගිය පුද්ගලයා සොයා ගෙන අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පදවිය පොලිස් ස්ථානයේ දෛනික තොරතුරු සටහන් පොතෙහි පිටුව 108 ඡේදය 3243 යටතේ 2023.07.27 වන දින පැය 01.15ට යොදා ඇති නිලධාරීන්ගේ පිටවීමේ සටහන අනුව ස්ථානාධිපතිගේ නියෝග අනුව 1 වන

වගඋත්තරකාර උප.පො.ප. සුදත් ප්‍රියශාන්ත, 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 3 වන වගඋත්තරකාර පො.කො. 101676 පිටදෙණිය, 4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො.කො. 93801 සුරංග සහ 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ යන නිලධාරීන් 2023.07.27 වන දින පැය 2.00 සිට පැය 6.00 දක්වා පුල්මුඩේ මාර්ගයේ 03 කණුව හන්දිය අසල මාර්ග බාධක රාජකාරියේ යෙදීම සඳහා පිටව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, පදවිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2023.07.27 වන දින පැය 06.15ට පිටුව 123 ඡේදය 150 යටතේ 1 වන වගඋත්තරකාර උප.පො.ප. සුදත් ප්‍රියශාන්ත නිලධාරියා විසින් පැමිණීමේ සටහන් යොදා ඇති අතර, එකී සටහන අනුව වගඋත්තරකරුවන් මෙහෙයුම් රාජකාරීවල යෙදී ඇති බවටත්, මෙම රාජකාරියේදී අංක එන්.සී.ටී.එම්. 3886 දරණ බජාජ් වර්ගයේ කළු පාට ප්ලැටිනා යතුරු පැදිය නවතා පරීක්ෂා කරන ලද බවටත්, එහිදී මෙම යතුරු පැදිය සඳහා වන ආදායම් බලපත්‍රය, රක්ෂණ සහතිකය, දුම් සහතිකය, රියදුරුගේ රිය පැදවීමේ බලපත්‍රය නොමැති බවට අනාවරණය වූ බවටත් සඳහන් කර ඇත. එසේම, එකී යතුරු පැදියේ පිටුපස බැඳ තිබූ උරයක මස් වර්ගයක් ඇති බවට හඳුනාගත් බවටත්, එහිදී මස් වර්ගය මොනවා දැයි යතුරු පැදිකරුගෙන් විමසන ලද බවටත්, එහිදී යතුරු පැදිකරු කියා සිටියේ, මුව මස් ටිකක් කෑමට ගෙදර ගෙනියන්න යාළුවෙකුගෙන් අරගත් බව වන බවටත්, නිලධාරීන්ගේ විදුලි පන්දම් දල්වා මෙහෙයුමේ සිටි අනෙක් නිලධාරීන්ගේද සහය ඇතිව පරීක්ෂා කර බලා සැකකරු පැවසූ පරිදි එහි තිබූ මස්, මුව මස් බවට හඳුනා ගන්නා ලද බවටත්, ඒ අනුව මුව මස් ළඟ තබා ගැනීමේ වරදට වරද කියා දී මෙදින පැය 5.00 ට සැකකරුව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවටත්, අනතුරුව යතුරු පැදිය සමඟ අත්අඩංගුවට ගත් මස් හා සැකකරුව (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කරන ලද මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති බවටත් වැඩිදුරටත් එකී සටහන මගින් දක්වා ඇත.

තවද, එකී සටහනට පහළින් 2023.07.27 වන දින උප සේවය භාරව කටයුතු කර ඇති පො.කො. 99536 මධුශංඛ නිලධාරියා විසින් පැමිණිලිකරු පරීක්ෂා කර භාරගත් බවටත්, පැමිණිලිකරුට වෙනත් අසනීප නැති බවටත්, තුවාල කිසිවක් නොමැති බවටත් සටහනක් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

වැටලීම භාරව කටයුතු කරන ලද 1 වන වගඋත්තරකරු විසින් පදවිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2023.07.28 වන දින පැය 09.50ට පිටුව 136 ඡේදය 162 යටතේ විභාග සටහන් යොදා ඇති අතර, එකී විභාග සටහනට අනුව යතුරු පැදියෙන් පැමිණි පැමිණිලිකරුව නවතා ගනු ලැබූ බවත්, ඔහු එකවරම කැලය දෙසට දුවන්නට තැත්කළ බවත්, එවිට ඔහුව ලුහුබැඳ අල්ලා ගත් බවත්, ඔහුව පාලනය කර ගැනීම අපහසු වූ බැවින් පොරබදා පාලනය කර ගෙන ආ බවත්, ඔහුට අත්විලංගු දමන ලද බවත් සටහන් කර ඇත. එමෙන්ම, ඔහු පැමිණි යතුරු පැදිය පරීක්ෂා කිරීමේදී යතුරු පැදිය පැදවීමට රියදුරු බලපත්‍රයක්, රක්ෂණ සහතිකයක්, ආදායම් බලපත්‍රය,

නාඳුනන පුද්ගලයෙකුගෙන් කෑම සඳහා මස් අරගත් බව වන බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම භාරව කටයුතු කළ 1 වන වගඋත්තරකරු විසින් පදවිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2023.07.27 වන දින පැය 06.15ට පිටුව 123 ඡේදය 150 යටතේ යොදා ඇති ඉහත කී පැමිණීමේ සටහනෙහි ඔහු සටහන් කර ඇත්තේ, අදාළ යතුරු පැදිය පරීක්ෂා කළ බවත්, එහිදී යතුරු පැදියට අදාළ ලේඛන නොතිබූ බවට අනාවරණය වූ බවත්, මුව මස් අඩංගු පාර්සලයක් තිබූ බවත්, පැමිණිලිකරුගෙන් ප්‍රශ්න කිරීමේදී මුව මස් ඔහු ලබා ගත්තේ යාළුවෙකුගෙන් බව පැවසූ බවත් ය. එකී සටහන තුළ අන්තර්ගත කරුණු අනුව පැමිණිලිකරු පලා යාමට තැත් කරන ලද බවට හෝ පලාගිය බවට හෝ පලායන විට නිලධාරීන් ලුහුබැඳ ගොස් අත්අඩංගුවට ගත් බවට වන කරුණු සටහන් කර නොමැත.

එහෙත් ඉහත කී 1 වන වගඋත්තරකරු විසින් පදවිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2023.07.28 වන දින පැය 09.50ට පිටුව 136 ඡේදය 162 යටතේ යොදා ඇති විභාග සටහනෙහි පැමිණිලිකරු පැමිණි යතුරු පැදිය දමා පලා යාමට තැත්කළ බවත්, පො.සැ. 64679 දයාවංශ නිලධාරියා ඔහුව ලුහුබැඳ අල්ලා ගත් බවත්, පැමිණිලිකරු පොරබදා පාලනය කිරීමට අපහසු බැවින් අත්විලංගු දමා යතුරු පැදිය අසලට රැගෙන ආ බවත්, ඔහු ළඟ තිබූ මස් නාඳුනන පුද්ගලයෙකුගෙන් ලබා ගන්නා ලද බවට වගඋත්තරකරුට පැවසූ බවත් සඳහන් කර ඇත.

එසේම, 1 වන වගඋත්තරකරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2024.07.03 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් සහ 2025.03.06 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී සිදු කර ඇති ප්‍රකාශය මගින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ යතුරු පැදිය නවතා පරීක්ෂා කිරීමේදී ඔහු පලාගිය බවත්, ඒ අනුව මෝටර් රථ කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව ඔහුව සොයා ඔහුගේ නිවසට වගඋත්තරකරුවන් ගිය බවත්, ඔහුගේ නිවසේදී ඔහුව අත්අඩංගුවට ගත් බවත් ය. ඒ අනුව 1 වන වගඋත්තරකරුගේ ඉහත කී සටහන් අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ මාර්ගයේ දී බව සඳහන් කර තිබුණ ද, 1 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුගේ නිවසේ දී ඔහුව අතුඅඩංගුවට ගනු ලැබූ බව ය.

ඒ අනුව 1 වන වගඋත්තරකරුගේ 2023.07.27 වන දින පැය 06.15ට පිටුව 123 ඡේදය 150හි යොදා ඇති පැමිණීමේ සටහන, 2023.07.28 වන දින පැය 09.50ට පිටුව 136 ඡේදය 162හි යොදා ඇති විභාග සටහන, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2024.07.03 දිනැති දිවුරුම් ප්‍රකාශය සහ 2025.03.06 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී සිදු කර ඇති ප්‍රකාශය සසඳා බැලීමේදී එකිනෙකට වෙනස් කරුණු ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය වේ.

4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න නිලධාරියා විසින් පදවිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි 2023.08.03 වන දින පැය 12.30ට පිටුව 188 ඡේදය 19 යටතේ යොදා ඇති විභාග සටහන අනුව පැමිණිලිකරු පැමිණි යතුරු පැදිය නවතා පරික්ෂා කිරීමේ දී ඔහු යතුරු පැදිය දමා කැලය දෙසට දිව ගිය බවත්, ඒ අවස්ථාවේ පො.සැ. 64679 දයාවංශ නිලධාරියා සමඟ එක්ව පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවත්, පැමිණිලිකරුගේ යතුරු පැදියේ පිටුපස තිබූ බෑගයෙහි මුව මස් තිබූ බවත්, පැමිණිලිකරු ද රැගෙන ඔහුගේ නිවස වෙත ගොස් නිවස සහ ඒ අවට පරීක්ෂා කළ බවත්, නීතිවිරෝධී කිසිවක් හමුනොවූ බවත් සඳහන් කර ඇත.

එහෙත් 4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත 2024.06.28 දිනැති දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ යතුරු පැදිය නවතා පරීක්ෂා කිරීමේදී ඔහු පලාගිය බවත්, ඒ අනුව මෝටර් රථ කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව ඔහුව සොයා ඔහුගේ නිවසට වගඋත්තරකරුවන් ගිය බවත්, ඔහුගේ නිවසේදී ඔහුව අත්අඩංගුවට ගත් බවත් ය.

ඒ අනුව 4 වන වගඋත්තරකරුගේ ඉහත කී විභාග සටහන අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ මාර්ගයේ දී බව සඳහන් කර තිබුණ ද, 4 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුගේ නිවසේ දී ඔහුව අතුඅඩංගුවට ගනු ලැබූ බව ය. එබැවින් 4 වන වගඋත්තරකරු විසින් ද පැමිණිලිකරු අත්අඩංගුවට ගත් ස්ථානය සම්බන්ධයෙන් එකිනෙකට පරස්පර විරෝධී වූ කරුණු දැක්වීම් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ නිලධාරියා විසින් 2023.08.02 වන දින පැය 20.10ට පිටුව 177 ඡේදය 13 යටතේ යොදා ඇති විභාග සටහන අනුව පැමිණිලිකරු පැමිණි යතුරු පැදිය නවතා පරික්ෂා කිරීමේ දී ඔහු යතුරු පැදිය දමා කැලය දෙසට දිව ගිය බවත්, තමා ඔහුව ලුහුබැඳ අල්ලාගත් බවත් සඳහන් කර ඇත. 7 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති 2024.07.05 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් සඳහන් කර ඇත්තේ ඔවුන් රාජකාරී කරමින් සිටි පුල්මුඩේ පාර, තුනේ කණුව ප්‍රදේශයේ දී පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවයි. ඒ අනුව 7 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇති පරිදි පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ මාර්ගයේ දී ය.

ඉහත කී 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ නිලධාරියා හැර අනෙකුත් නිලධාරීන් වන 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, සහ 6 වන වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශ මගින් සහ 2025.03.06 වන දින දෙපාර්ශවය කැඳවා කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේ දී ලබා දී ඇති ප්‍රකාශ මගින් පැමිණිලිකරුගේ යතුරු පැදිය නවතා පරීක්ෂා කිරීමේදී ඔහු පලාගිය බවත්, ඒ අනුව මෝටර් රථ කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව ඔහුව සොයා ඔහුගේ නිවසට වගඋත්තරකරුවන් ගිය බවත්, ඔහුගේ නිවසේදී ඔහුව අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත. එලෙස 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන සහ 6 වන වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශ මගින් මෝටර් රථ කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව

පැමිණිලිකරුගේ නිවස සොයා ගොස් එකී නිවසේදී පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ නිලධාරියා ද සහභාගී වූ බවත් සඳහන් කර තිබුණ ද, 7 වන වගඋත්තරකරු විසින් පොලිස් ස්ථානයේ තොරතුරු පොතෙහි යෙදූ ඉහත කී විභාග සටහනෙහි හෝ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති 2024.07.05 දිනැති දිවුරුම් ප්‍රකාශයෙහි එවැනි කරුණක් සඳහන් කර නැත.

ඒ අනුව සලකා බැලීමේ දී පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන සහ 7 වන වගඋත්තරකාර නිලධාරීන් විසින් 2023.07.27 වන දින පැය 05.00ට පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවට සඳහන් කළ ද, පැමිණිලිකරු අත්අඩංගුවට ගත් ස්ථානය සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති මුල් පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ, ඔහු කුඹුරේ සිට නිවස බලා පැමිණෙමින් සිටියදී පුද්ගලයෙකු පාර මැදට පැන තමාව නතර කිරීමට උත්සාහ කළ බවත්, ඒ සමගම බෝගස් හන්දිය දෙසින් ඔහු සිටි දෙසට වාහනයක් පැමිණි බවත්, පාරේ සිටි පුද්ගලයා ඔහු අත තිබූ පාර්සලය වීසි කර දමා කැලයට පැන දිව ගිය බවත්, පැමිණි පිරිස කැලේ තිබූ පාර්සලය ගෙනවිත් එය දමා ගිය පුද්ගලයා කවුරුන්ද යන්න පිළිබඳව තමාගෙන් විමසන ලද බවත් ය.

එසේම, මෙම පැමිණිල්ලට අදාළව 2025.03.06 වන දින කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණයේදී පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, 2023.07.27 වන දින පාන්දර පැය 4.30ත් 5.00ත් අතර කාලයේ කුඹුරේ සිට ගෙදර එන විට කැබ් රථයක් පැමිණ තමා නවතා එහි සිටි පිරිස තමා වටකර ගත් බවත්, එහි සිටි එක් නිලධාරියෙකු මස් පාර්සලයක් පෙන්නූ බවත්, මස් අයිතිකරු කවුදැයි තමාගෙන් විමසූ බවත් ය.

ඒ අනුව පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත මුලින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලත්, කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ලබා දී ඇති ප්‍රකාශයත් සලකා බැලීමේදී ලිඛිත පැමිණිල්ල හා ප්‍රකාශය අතර වෙනස් කරුණු ඇතුළත්ව ඇති බවත්, කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී මුල් පැමිණිල්ලේ සඳහන් කර තිබූ පැමිණිලිකරුගේ යතුරු පැදිය මාර්ගයට පැමිණි පුද්ගලයෙකු විසින් නතර කිරීමට උත්සහ කළ බවට ප්‍රකාශ කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව මැරීමට තහනම් සතෙකු වන මුවකුගේ මස් කිලෝ ග්‍රෑම් 02ක් සන්තකයේ තබා ගනිමින් අංක එන්.සී.ටී.එම්.3886 දරණ යතුරු පැදියෙන් ප්‍රවාහනය කිරීම යන චෝදනාව යටතේ කැබිතිගොල්ලෑව මහේස්ත්‍රාත් අධිකරණය වෙත නඩුවක් ගොනු කර ඇත.

වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ හා කොමිෂන් සභාව වෙත පැමිණ ලබා දී ඇති ප්‍රකාශයන් අනුව පැමිණිලිකරු විසින් පදවාගෙන ආ යතුරු පැදිය නවත්වා පරීක්ෂා කළ බවත්, එසේ පරීක්ෂා කිරීමේදී පැමිණිලිකරු යතුරු පැදිය දමා පලාගිය බවත්, පසුව වගඋත්තරකරුවන් විසින්

යතුරු පැදියේ හිමිකරු පිළිබඳව තොරතුරු ලබාගෙන පැමිණිලිකරුගේ නිවස වෙත ගොස් ඔහුව අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත. එහෙත් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු පලාගිය බවට වන තොරතුරු ඔවුන්ගේ පැමිණීමේ සටහනෙහි සහ විභාග සටහන්වල යොදා නොමැති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගත් බවටත්, ඔහුට වගඋත්තරකරුවන් පහරදුන් බවටත්, සඳහන් කරමින් පැමිණිලිකරු කැබිතිගොල්ලෑව දිස්ත්‍රික් 11 සහකාර පොලිස් අධිකාරී වෙත පැමිණිල්ලක් සිදු කර ඇති අතර, එකී පැමිණිල්ල පදනම්ව විමර්ශනයක් පවත්වා අංක B 614/2024 යටතේ පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවෙකුට අතින් පයින් හා පොලුවලින් පහරදීමේ චෝදනාව යටතේ  වගඋත්තරකරුවන්ට එරෙහිව කැබිතිගොල්ලෑව මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් 2025.03.06 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ප්‍රකාශ කර ඇත්තේ, තමාව අත්අඩංගුවට ගැනීමෙන් පසුව 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො.කො. 93801 සුරංග සහ 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ යන නිලධාරීන් ඔහුට පහර දුන් බවයි. එසේම, 1 වන වගඋත්තරකාර උ.පො.ප. සුදත් ප්‍රියශාන්ත සහ 3 වන වගඋත්තරකාර පො.කො. 101676 පිටදෙණිය යන නිලධාරීන් තමාට පහර නොදුන් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ, 2023.07.27 වන දින තමා හට කැබිතිගොල්ලෑව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලැබීමෙන් අනතුරුව ඒවේලාවේදීම කැබිතිගොල්ලෑව රෝහලට ඇතුළත් වූ බවත්, එම රෝහලෙන් එදිනම තමාව අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත යැවූ බවත්, 2023.07.27 වන දින සිට 2023.07.30 වන දින දක්වා අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලැබූ බවත් ය. ඒ අනුව අනුරාධපුර ශික්ෂණ රෝහල වෙතින් පැමිණිලිකරු හට නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවීමට කටයුතු කර ඇති අතර, එකී අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරු 2023.07.27 වන දින ප.ව.9.50ට අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත ඇතුළත්ව ඇත. එම අධිකරණ වෛද්‍ය වාර්තාවේ "රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසය" යටතේ 2023.07.27 වන දින පෙ.ව. 4.30ට පමණ පදවියේ දී ඔහුට පොලිස් නිලධාරීන් 05 දෙනෙකු විසින් අත් වලින්, පාද වලින් හා පොලු වලින් පහරදීමක් සිදුකළ බවට ප්‍රකාශ කොට ඇත.

තවද, එම අධිකරණ වෛද්‍ය වාර්තාවේ පැමිණිලිකරුගේ ශරීරයේ තිබූ තුවාල පහත පරිදි සටහන් කර ඇත.

"External Examination:-

(i). 8x1cm contusion over above right knee.

(ii). 7x0.5cm contusion over medical aspect of right knee.

(iii). 9x0.5cm contusion over medical aspect of left knee.

(iv). 7x2cm contusion over left buttock.

එසේම, එකී තුවාල වලට අදාළව අධිකරණ වෛද්‍යවරයාගේ මතය පහත පරිදි සටහන් කර ඇත.

Conclusion and Opinion:-

(i). Injuries are non-grievous under the section 311 of penal code.

(ii). The age and the nature of injuries are compatible with the given history by the patient."

ඒ අනුව ඉහත කී තුවාල බරපතළ නොවන තුවාල වන බවත්, රෝගියා විසින් ලබාදෙන ලද ඉතිහාසය සමඟ සැසඳෙන බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇත.

පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව කරනු ලබන පහරදීමේ චෝදනාව වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඔවුන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරු පදවාගෙන ආ යතුරු පැදිය සංඥා කර නවැත්වීමෙන් පසුව පරික්ෂා කිරීමට සූදානම් වීමේදී ඔහු යතුරු පැදිය දමා කැලයට පලා ගිය බවයි. පලාගිය පැමිණිලිකරුව අල්ලා ගැනීම සඳහා ඔහුව ලුහුබැඳ ගියද ඔහුව අල්ලා ගැනීමට නොහැකි වූ බවයි. පසුව යතුරු පැදියේ හිමිකරුගේ තොරතුරු මෝටර් රථ කාර්යාලයෙන් ලබාගෙන ඔහුගේ නිවසට ගිය බවත්, ඔහු ගෙදර සිටි බවත්, ඒ අනුව නිවසේදී ඔහුව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත්, කිසිදු පහරදීමක් සිදුකර නොමැති බවත් ය. එසේම, මෙම පැමිණිලිකරුව අධිකරණය වෙත ඉදිරිපත් කළ අවස්ථාවේදී ඔහුට පහරදීමක් සිදුවූයේ නම් ඒ පිළිබඳව අධිකරණය වෙත දන්වා සිටීමට ඔහුට අවස්ථාව තිබූ බව ද වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පැමිණිල්ලට අනුව ඔහුට වගඋත්තරකරුවන් පහර දී ඇත්තේ, අළුත්හල්මිල්ලෑව කනත්ත ආසන්නයේ ඔහුගේ යතුරු පැදිය නවත්වන ලද ස්ථානයේදී සහ අළුත්හල්මිල්ලෑව පාලම යටදී ය.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුව පරික්ෂා කිරීමට යාමේදී ඔහු පැන ගිය බවත්, පැමිණිලිකරුව ඔහුගේ නිවසේදී අත්අඩංගුවට ගත් බවත් ය. එසේම, වැටලීමට සම්බන්ධ වූ 1 සිට 7 දක්වා වගඋත්තරකරුවන් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවයි.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති මුල් පැමිණිල්ල, කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරික්ෂණයේදී ලබාදී ඇති ප්‍රකාශය සහ වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති සියළුම තොරතුරු සලකා බැලීමේදී පැමිණිලිකරුට වගඋත්තරකරුවන්

විසින් පහරදීමක් සිදුකර ඇත්තේ, කුමන ස්ථානයේ දී ද යන්න පිළිබඳව නිශ්චිත නිගමනයකට එළැඹීමේ හැකියාවක් නොමැත.

කෙසේ වෙතත් පැමිණිලිකරු සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති ඉහත කී අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තොරතුරු සලකා බැලීමේදී පැමිණිලිකරුගේ ශරීරයේ පවතින තුවාලවල ස්වාභාවය පැමිණිලිකරු විසින් වෛද්‍යවරයා වෙත ලබාදෙන ලද රෝග ඉතිහාසය සමඟ සැසඳෙන බව අධිකරණ වෛද්‍යවරයා විසින් සටහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු විසින් තමා හට පොලිස් නිලධාරීන් 05 දෙනෙකු අත් වලින්, පාද වලින් හා පොලු වලින් පහරදුන් බවට ලබා දී ඇති රෝග ඉතිහාසය සමඟ ඔහුගේ ශරීරයේ පැවති තුවාල සැසඳෙන බව අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇති බව නිරීක්ෂණය වේ.

තවද, අනුරාධපුර ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබා නිවසට පැමිණීමෙන් අනතුරුව තමාගේ රෝගී තත්ත්වය උත්සන්න වීම හේතුවෙන් 2023.08.01 වන දින සිට 2023.08.03 වන දින දක්වා පදවිය මූලික රෝහලට ඇතුළත්ව ප්‍රතිකාර ලැබූ බව ද පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. ඒ අනුව පදවිය මූලික රෝහල වෙතින් වෛද්‍ය වාර්තාවක් කැඳවීමට කටයුතු කර ඇති අතර, පදවිය මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් 2024.02.12 දිනැති ලිපියක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් සඳහන් කොට ඇත්තේ, පැමිණිලිකරු රෝහලේ රැඳී සිටින ලද කාලය තුළ හිසරදය, කරකැවිල්ල සඳහා ප්‍රතිකාර ලබාගෙන ඇති බවත්, ඔහු විසින් පහරදීමක් පිළිබඳව වෛද්‍යවරුන් වෙත පැමිණිල්ලක් කර නොමැති බවත් ය.

<u>නිගමනය</u>

යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සිදු වූ අවස්ථාවකදී අදාළ අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී වූ සියලුම නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කරුණු සමාන විය යුතු ය. එසේම, යම් නිලධාරියෙකු විසින් එක් අත්අඩංගුවට ගැනීමේ සිදුවීමකට අදාළව පොලිස් ස්ථානයේ විවිධ තොරතුරු පොත් වල යොදනු ලබන සටහන් එක හා සමාන කරුණු වලින් සමන්විත විය යුතු ය. විශේෂයෙන්ම අත්අඩංගුවට ගනු ලැබූ දිනය, වේලාව, ස්ථානය, අත්අඩංගුවට ගැනීමට හේතු වූ කරුණු, අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී එම සැකකරුගේ හැසිරීම යනාදී කරුණු සමාන විය යුතු ය. එසේම, යම් තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීමට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ආයතනයක් මගින් සිදු කරනු ලබන පැමිණිලි පරීක්ෂණයක දී එවැනි ආයතනයක් වෙත කරුණු වාර්තා කිරීමේදී අදාළ අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ සියලුම නිලධාරීන් විසින් එකී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කරුණු ද එක සමාන විය යුතු ය. එසේ නොවුණොත් එම නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු වල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නඟී.

මෙම පැමිණිල්ලට අදාළව සලකා බැලීමේදී ඉහතින් සඳහන් කර ඇති පරිදි 1 වන සහ 4 වන වගඋත්තරකරුවන් පොලිස් ස්ථානයේ තොරතුරු පොත් වල සටහන් යෙදීමේදී පැමිණිලිකරු මාර්ගයේදී අත්අඩංගුවට ගත් බවට සඳහන් කළ ද, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ මගින් සහ මෙම පැමිණිල්ලට අදාළව 2025.03.06 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරික්ෂනයේ දී ලබා දී ඇති ප්‍රකාශ මගින් දක්වා ඇත්තේ, පැමිණිලිකරු ඔහුගේ නිවසේදී අත්අඩංගුවට ගත් බවයි. එසේම, 2 වන, 3 වන, 5 වන සහ 6 වන වගඋත්තරකරුවන් විසින් ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ මගින් සහ මෙම පැමිණිල්ලට අදාළව 2025.03.06 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරික්ෂණයේ දී ලබා දී ඇති ප්‍රකාශ මගින් දක්වා ඇත්තේ, පැමිණිලිකරු ඔහුගේ නිවසේදී අත්අඩංගුවට ගත් බවයි. එසේම, 7 වන වගඋත්තරකරු විසින් පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන අංශයේ තොරතුරු සටහන් පොතෙහි යොදා ඇති විභාග සටහන මගින් සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇත්තේ පැමිණිලිකරු මාර්ගයේදී අත්අඩංගුවට ගත් බවයි.

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් 2023.07.27 වන දින පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරු වේ. එසේම, ඉහත කරුණු අනුව සලකා බැලීමේ දී පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන සහ 7 වන වගඋත්තරකාර නිලධාරීන් විසින් 2023.07.27 වන දින පැය 05.00ට පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවට සඳහන් කළ ද, පැමිණිලිකරු අත්අඩංගුවට ගත් ස්ථානය සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන සහ 7 වන වගඋත්තරකාර නිලධාරීන් සියලු දෙනා පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී වී ඇත්තේ එකම අවස්ථාවකදී වන බැවින්, පැමිණිලිකරු අත්අඩංගුවට ගනු ලැබූ දිනය, වේලාව, ස්ථානය, අත්අඩංගුවට ගැනීමට හේතු වූ කරුණු, අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී එම සැකකරුගේ හැසිරීම යනාදිය සම්බන්ධයෙන් වන ඔවුන්ගේ කරුණු දැක්වීම් එක සමාන විය යුතු ය. එවැනි පසුබිමක් තුළ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන සහ 7 වන වගඋත්තරකාර නිලධාරීන් විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගත් ස්ථානය සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් කරුණු ඉදිරිපත් කිරීම තුළින් පැමිණිලිකරු අත්අඩංගුවට ගත් ස්ථානය නිශ්චිතව තහවුරු නොවන අතර, එකී නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු වල විශ්වසනීයත්වය ද බිඳ වැටේ. එබැවින් තමාව වගඋත්තරකාර නිලධාරීන් විසින් මාර්ගයේ දී අත්අඩංගුවට ගත් බවට පැමිණිලිකරු විසින් සිදු කර ඇති ප්‍රකාශය පිළිගැනීමේ වැඩි සම්භාවිතාවයක් පවතින බව නිරීක්ෂණය වේ. මෙම කරුණු අනුව පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී ඒ සඳහා සාධාරණ හේතුවක් පැවති බවට වගඋත්තරකරුවන් විසින් නිශ්චිතව තහවුරු කර නොමැත.

එසේහෙයින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන

වගඋත්තරකාර උප.පො.ප. සුදත් ප්‍රියශාන්ත, 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 3 වන වගඋත්තරකාර පො.කො. 101676 පිටදෙණිය, 4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො.කො. 93801 සුරංග සහ 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ යන නිලධාරීන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු 2023.07.27 වන දින පැය 11.50ට අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට රැගෙන ගොස් ඇත. අධිකරණයෙන් ඇප ලැබීමෙන් අනතුරුව පැමිණිලිකරු කැබිතිගොල්ලෑව රෝහලට ඇතුළු වී ඇති බවත්, එදිනම එනම්, 2023.07.27 වන දින ප.ව.09.50ට අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත ඇතුළත්ව ඇති බවත් නිරීක්ෂණය වේ. එහිදී අධිකරණ වෛද්‍යවරයා විසින් 2023.07.30 වන දින පෙ.ව.11.00ට පැමිණිලිකරු පරීක්ෂා කර ඇති අතර, ඉහතින් සඳහන් කරන ලද බරපතළ නොවන තුවාල හතරක් පැමිණිලිකරුගේ ශරීරයේ ඇති බවට සටහන් කර ඇත. පදවිය පොලිස් ස්ථානයේ දූෂණ මර්ධන තොරතුරු සටහන් පොතේ 2023.07.27 වන දින පැය 06.15ට පිටුව 123 සහ ඡේදය 150 යටතේ උප සේවය භාරව කටයුතු කර ඇති පො.කො. 99536 මධුශංඛ නිලධාරියා විසින් පැමිණිලිකරු පරීක්ෂා කර භාරගත් බවටත්, පැමිණිලිකරුට වෙනත් අසනීප නැති බවටත්, තුවාල කිසිවක් නොමැති බවටත් සටහනක් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරු පදවිය පොලිස් ස්ථානය වෙත රැගෙනවිත් උපසේවය වෙත භාරදෙන අවස්ථාවේ දී ඔහුගේ ශරීරයේ කිසිදු තුවාලයක් නොතිබුණ ද, ඔහු පොලිස් භාරයේ සිට අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එදිනම රෝහල්ගත වූ අවස්ථාවේ දී පැමිණිලිකරුගේ ශරීරයේ තුවාල ඇති බවට අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර තිබීම තුළින් අදාළ තුවාල පැමිණිලිකරු පොලිස් නිලධාරීන් භාරයේ සිටියදී සිදු වූ ඒවා බව තහවුරු වේ.

එසේම, පහරදීමක් සම්බන්ධයෙන් වන පැමිණිල්ලකදී ප්‍රබලතම සාක්ෂියක් වන්නේ අධිකරණ වෛද්‍ය වාර්තාව ය. ඒ අනුව පැමිණිලිකරු විසින් තමා හට පොලිස් නිලධාරීන් 05 දෙනෙකු අත් වලින්, පාද වලින් හා පොලු වලින් පහරදුන් බවට ලබා දී ඇති රෝග ඉතිහාසය සමඟ ඔහුගේ ශරීරයේ පැවති තුවාල සැසඳෙන බව අධිකරණ වෛද්‍යවරයා විසින් පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි සඳහන් කර ඇති බැවින් පැමිණිලිකරු හට පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදු කර ඇති බව තහවුරු වේ. පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො.කො. 93801 සුරංග සහ 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ යන නිලධාරීන් ඔහුට පහර දුන් බවයි.

<u>අමල් සුදත් සිල්වා එ. පො.ප. කොඩිතුවක්කු</u> (1987) 2 Sri L.R. 119 නඩුවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කිසිම තැනැත්තෙකු වධහිංසාවලට කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවත්, එය කිසිදු සීමාවකට

යටත් කර නොමැති මූලික අයිතිවාසිකමක් බවත්, යම් පුද්ගලයෙකු අපරාධකරුවෙකු වුවද මෙම මූලික අයිතිවාසිකම ඔහුට ද එලෙසින්ම අදාළ වන බවත් සඳහන් කර ඇත.

එසේහෙයින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 4 වන වගඋත්තරකාර පො. කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො.කො. 93801 සුරංග සහ 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ යන වගඋත්තරකාර නිලධාරින් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, 1 වන වගඋත්තරකාර උ.පො.ප. සුදත් ප්‍රියශාන්ත සහ 3 වන වගඋත්තරකාර පො.කො. 101676 පිටදෙණිය යන නිලධාරීන් තමාට පහර නොදුන් බව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇති බැවින් පහරදීමට අදාළව එම නිලධාරීන් දෙදෙනා වෙත වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් <u>මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා</u> එදිරිව <u>පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය</u> **(SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඒ අනුව 1 සිට 7 දක්වා වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී ඒ සඳහා සාධාරණ හේතුවක් පැවති බවට නිශ්චිතව තහවුරු කර නොමැති බැවින් එකී අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටිය අනුව සිදු කර ඇති බව තහවුරු නොවේ. එසේම, ඉහතින් සඳහන් කර ඇති පරිදි 2 වන, 4 වන, 5 වන, 6 වන සහ 7 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු හට පහරදීමක් සිදු කර ඇති බව ද තහවුරු වී ඇත. ඒ අනුව 8 වන වගඋත්තරකාර පදවිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් තමා යටතේ සිටින නිලධාරීන් සම්බන්ධයෙන් සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනී යයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 8 වන වගඋත්තරකරු විසින් ඔහුගේ අධීක්ෂණ වගකීම යටතේ ක්‍රියාකර ඇති ආකාරය අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ

විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 8 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

01. 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 4 වන වගඋත්තරකාර පො.කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො. කො. 93801 සුරංග සහ 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ යන නිලධාරීන් විසින් එක් අයෙකුගෙන් රුපියල් හත්දහස් පන්සියය (රු.7,500/-)ක මුදලක් බැගින් රුපියල් තිස්හත්දහස් පන්සියය (රු.37,500/-)ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 1 වන වගඋත්තරකාර උප.පො.ප. සුදත් ප්‍රියශාන්ත, 2 වන වගඋත්තරකාර පො.කො. 94507 කුමාර, 3 වන වගඋත්තරකාර පො.කො. 101676 පිටදෙණිය, 4 වන වගඋත්තරකාර පො. කො. 75131 වික්‍රමරත්න, 5 වන වගඋත්තරකාර පො.කො. 81247 රත්නායක, 6 වන වගඋත්තරකාර පො.කො. 93801 සුරංග, 7 වන වගඋත්තරකාර පො.සැ. 64679 දයාවංශ සහ 8 වන වගඋත්තරකාර ප්‍ර.පො.ප. එම්.ඩබ්.ඩබ්. කුමාරසිරි යන නිලධාරීන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. ජනවාරි 29 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් සහ පොලිස්පතිවරයා වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව



පිටපත් අනෙක් පිටුවෙහි ඇත.

පිටපත් :- 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.